# දඟකාර පුංචා.



නදින්සා හල්කේවල

*කෘතිය* *දගකාර පුංචා*

කතෘ නදින්සා හල්කේවල

ප්‍රථම මුද්‍රණය

පළමු කෘතිය    දගකාර පුංචා

කතෘ    නදින්සා හල්කේවල

කෘතිය පළකරන දිනය    2023.11.15

ISBN 978-624-206-675-2

# පිදුම

කුළුදුල් නිර්මාණයක් වු දගකාර පුංචා එදිනෙදා ජීවිතයේදී මුහුණ දීමට සිදුවෙන, මුණගැසෙන විවිධ කරුණු අලලා ලියැවුණු කෙටිකතාවකි. මෙම පොත රචනා කිරිම සදහා මා ධෛර්්‍යමත් කළ මගේ ආදරණීය මව, පියා හා සහෝදරයා මේ මොහොතේදී තුති පුදමි.

මා මෙම ග්‍රන්ථය රචනා කිරීමට අදහස් කළේ සතියක පමණ කාලයක් ඉතිරිව තිබියදීය. ඒ අවස්ථාවේදී මහාමායා විදුහලේ සෙනෙවිරත්න මහලේකම් ගුරුපියාණන් ඒ සදහා දුන් අවස්ථාව ඉතා අගය කොට සලකමි.

නිවසේ නොසිටියද, දුර බැහැරක සිට හිද දුරකථනයෙන් අමතා මාගේ ග්‍රන්ථයේ විස්තර අසන මාගේ ආදරණීය අත්තම්මා, අත්තා අමතක කළ යුතු නොවේ.

එමෙන්ම මාහට පළමු ශ්‍රේණියේ දී අකුරු ඉගැන්වූ ආදර තිලකා ගුරුතුමියට ද මාගේ ස්තූතිය පුද කරමි.

පිටකවරය නිර්මාණය කර දුන් 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සනුති චමිෂ්කා නැගණියටද මාගේ ස්තූතිය පුද කර සිටිමි.

නන් අයුරින් උදවු උපකාර කළ සැමට මාගේ ප්‍රණාමය !

එච්.එම්. එන්.නදින්සා හල්කේවල,

378 ඩී, බිබිල හංදිය,

නාඋල, මාතලේ.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණකරණය සහජයෙන් උරුමකර ගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අපහා එක් වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය- මහනුවර

# දඟකාර පුංචා

ඔන්න එකෝමත් එක කාලෙක ඈත දුෂ්කර ගමක දුප්පත් පවුලක් ජීවත් වුණා. මේ ගමේ නම තමයි ඇහැටුවැව. මේ පවුලේ පුංචා කියලා ළමයෙකුයි, අම්මයි, තාත්තයි, සීයයි ජීවත් වුණා. පුංචාගේ ඇත්ත නම පුංචා නෙවේ. ආදරයට කියන නම තමා පුංචා. එයාගේ නම නිමල්. ගමේ කට්ටිය හැමෝම නිමල්ට කියන්නේ පුංචා කියලා. පුංචාට ගමේ කවුරුත් කැමති නෑ. පුංචා හරිම දඟයි. එයා හැමෝටම කරදර කරන නිසා එයාට කිසිම යාළුවෙක්වත් නෑ. මේ පුංචට යාළුවෝ නෑ කිය කිය සිතා එයා ඒ පිළිබඳව දුක් වුණා. ඊට පස්සේ පුංචාගේ තාත්තා එයාට බලු පැටියෙක් ගෙනත් දුන්නා. එයාගේ නම චූටා. පුංචා චූටාට ගොඩක් ආදරෙයි. චූටාව නාවනවා, කන්න කෑම දානවා. ඒ නිසා චූටත් පුංචට ගොඩක්ම ආදරෙයි. පුංචා උදෙන් නැගිටපු ගමන්ම දිව යන්නේ චූටා ඉන්න තැනටයි. ඉතිං මේ පුංචාගේ ජීවිතයම වුනේ චූටා.

පුංචාගේ දෙමව්පියන්ගේ රැකියාව වෙලා තිබුණේ ගොවිතැනයි. එළවළු වගා කර ඒවා විකුණලා තමයි මෙයාලා මුදල් උපයා ගත්තේ. කොච්චර දඟ වුණත් එයා එයාගේ අම්මටයි ,තාත්තාටයි, සීයටයි එළවළු වගා කර ඒවා විකුණන්න උදවු කරනවා. මෙයාලා ජීවත් වුණේ එළවළු වගා කරලා ඒවා විකුණලා. මෙහෙම එයාලා වැඩ කර ඉන්න කොට මෙයාට මොනවත් කරන්න නැතිව කම්මැලි කමක් ඇති වුණා. ඊට පස්සේ පුංච හිතුවා මම මේ කොටුවට එන සත්තු එළවන්න ඕනේ කියලා. එතකොට චූටා හිටියේ තද නින්දක. ඉතින් පුංචා තනියම කැලයට ගිහින් පොඩි ලී කෑලි දෙකකුත් හොයාගෙන කැටපෝලයක් හදා ගත්තා. ඒකෙන් එයා දැන් සත්තුන්ට ගල් ගහන්න පටන් අරගෙන. සත්තු මැරි මැරී වැටෙනවා. ඒකට එයාගේ දෙමව්පියන් හරිම විරුද්ධයි. පුංචා සත්තු මරලත් හරිම සතුටක් ලබනවා. එයාගේ වැඩ නිසා එයාගේ දෙමව්පියන් ගමේ හැම කෙනෙක්ගෙන්ම

බැනුම් අහනවා. ළමයට හොඳ නරක කියලා දීලා නැහැ කියලා. ඒ අසරණ අම්මාගෙයි, තාත්තාගෙයි දුක කාටවත්ම දැනෙන්නේ නැහැ. ඒත් එයා ඒක නතර කරන්නෙත් නැහැ.

පුංචා තනියම හදාගත්ත මේ කැටපෝලය දවස් දෙකකින් තුනකින් විතර කැඩුණා. දැන් මේ කැටපෝලය කැඩුන එක ගැනම හිත හිතා පුංචා දුක් වුණා ඔය විදිහටම දවස් ගෙවුණා. ඒ අතර තුරදී පුංචාට හිතුණා වුටත් එක්ක ගඟට යන්න. ගඟට ගියම ගගේ මාළු අල්ලන්න හිතිලා. දැන් මාළු ගෙදර අරගෙන යන්නේ කොහොමද කියලා කල්පනා කරනවා. කාගෙන්වත් අහන්න කෙනෙකුත් නැහැ. කල්පනා කර කර සිටි නිමල්ට එක පාරටම හිතුණා ගෙදර පොඩි බේසමක් තියනවා. හා.. ඒකට දාලා තියාගන්න පුළුවන් කියලා තමයි පුංචා හිතාගෙන හිටියේ එයා එහෙම හිතලා දැන් මේ මාළු ටික අරගෙන යන්න විදිහක් හොයාගන්න ඕනේ කියලා හිතාගෙන වටපිට බල බලා ඉන්නකොට පොඩි බෝතලයක් බිම වැටිලා තියනවා දැක්කා. බෝතලය අරගෙන මාළු ටික ඒකට දැම්මා.

පුංචා මේ මාළු අල්ලපු බෝතලෙත් අරගෙන ගෙදර ගියා . පුංචාගේ අම්මා ඇහැව්වා “මේ බෝතලය කාගෙද කොහෙන්ද කාගෙන් අහලාද ගත්තේ?” කියලා.

පුංචා මේ කරපු වැඩේ දැකලා පුංචට හොඳටම බැන්නා. ඒ වෙලාවේ පුංචගේ අම්මට හොඳටම තරහ ගිහින් හිටියේ. පුංචට හොඳටම දුක හිතුනා. එයා ගොඩක් වෙලාවක් ඇඩුවා. එයා ආපහු ගඟට ගිහින් ඒ මාළු ටික දැම්මා. පුංචට හරිම දුකයි.

පුංචා දඟ වැඩ කරලත් බැනුම් ඇහුවත් එයා ඒවා ගණනකට ගත්තේ නැහැ. එයා ඇහුවේ එයාගේ සීයා කියන දේවල් විතරයි. ඒ වගේම සීයාව සෙල්ලමටත් ගන්නවා. දවසක් සීයා එළවළු කොටුවේ වල් ගලවන්න

පුංචත් එක්කරගෙන ගියා. පුංචා ටික වේලාවක් එතන කැරකි කැරකි ඉද්දි එයාට එතන ඉන්න බෑ කියලා හිතිලා. ඊට පස්සේ එයා සීයට කිව්වා

"අනේ මටනම් දැන් මෙතන ඉන්න බෑ සීයේ මං ගෙදර යනවා කියලා." "හරි පුතේ එහෙනම් ගිහින් ගෙදරටට වෙලා ඉන්න මම ඩිංග වෙලාවකින් එන්නම් මේ වල් ටික ගලවලා" කියලා සීයා කිවුවා. ඊට පස්සේ හොඳයි සීයේ ඕන් මන් ගියා කියමින් කෑ ගසමින් දිව යන්න වුන පුංචා ඒ අසල තිබෙන ළිඳ දකින විට සිතෙනවා ළිඳ ළගත් මොහොතක් නතර වෙන්න. අතට ගලක් අරගෙන ඒ ළිඳට ගලක් දාලා දිව යන්න. එසැනින්ම ගලක් ළිඳට දමා දිවගිය පුංචා ගෙදර ගොස් හැංගුණේ සීයාව බිය වැද්දීමේ අදහසිනි. ඒ ශබ්දය ඇසුනු සීයා වහා ළිඳ ළගට විත්

"අනේ මගේ කොලුවා ............... අනේ මගේ කොලුවා ............... කවුරුත් නැද්ද බේරා ගන්න මගේ කොලුවා ළිඳට වැටුණා" කියා හූ හඩ දෙන්නට විය. එවිට ගමේ සියලු දෙනාම පුංචාව හොයනවා.

දැන් පුංචට සීයාගේ විලාපය ඇසෙනවා ඒ වුනාට පුංචා හොදට ගෙදර ඇඳ යටට වී හැංගිලා සිටිනවා. මොකද දැන් ගුටි කන්න වෙයි කියලා බයකුත් තිබ්බ නිසා. කොහොම හරි සීයා ගේ ඇතුළට ගියා. එතකොට මෙන්න පුංචා ඇඳ යට හැංගිලා ඉතිං පුංචා දිගටම දඟ වැඩ කර කර කාලය ගත කරා. මේ විදිහට කාලය ගත වෙද්දි පුංචට පාසැල් යාමට සුදුසු කාලයත් එළඹුණා. ඉතිං මෙයාගේ අම්මයි. තාත්තායි දෙන්නම එළවළු කොටුවෙන් කඩාගත් එළවළු ටිකකුත් විකුණන්න ගමේ පොළට ගියා. ඒ සල්ලි ටිකට හරියන විදිහට පුංචට සෙරෙප්පු කුට්ටමකුයි, සුදු කමිසයකුයි, කලිසමකුයි අරගෙන ආවා. අරගෙන ඇවිත් පුංච පෙන්නුවා. ඒක දැකලා නම් පුංචා ටිකක් සතුටු වුණා. ඒත් පාසැල් යන්න නම් ටිකක්වත් කැමති වුණේ නැහැ.

මොකද පුංචා සිතුවේ උදේ වරුවේ ඒ මේ අත දුව පැනයමින් සෙල්ලම් කරන මට ආයේ කවදාවත් සෙල්ලම් කරන්න බැරි වෙයි කියලයි.

පුංචා පාසැල් යන දිනය උදාවුණා. ගමේ තිබෙන ඇහැටුවැව කණිෂ්ඨ විදුහලට ඇතුලත් කරන්න දෙමව්පියන් තීරණය කළත් පුංචාගේ කිසිදු කැමැත්තක් තිබුණේ නැහැ, පාසැල් යන්න. අකමැත්තෙන් වුණත් පාසැල් නිළ ඇඳුම ඇඳගත් පුංචා සුදු කොකෙක් මෙන් බැබලුණේය. එයා එයාගේ අම්මයි, තාත්තයි එක්ක පාසැල් ගියා. පුංචා ඕලු පංතියට බාර දුන්නා. ඒ පංතිය හරිම ලස්සනයි. මේ පංතියේ ඉන්න ගුරුතුමිය හරිම කරුණාවන්තයි. ගුරුතුමියගේ නම පද්මා අයිරාංගනි. ඇය හරිම ලස්සනයි.

ඉතිං මේ ගුරුතුමිය පුංචට හරිම ආදරයෙන් කතා කළා. පුංචට දැන් නම් ටිකක් විතර පාසැල ගැන ආසා හිතුණා. එයා එයාගේ අම්මා දුන්න බුලත් හුරුල්ල ගුරුතුමියට දී වැන්දා. ඒ වෙලාවේ ගුරුතුමිය පුංචට ආශිර්වාද කර "මේ ළමයාගේ නම කියන්නකෝ" යැයි කීවා.

ඊට පස්සේ පුංචා හයියෙන් මුලු පංතියටම ඇහෙන්න "මගේ නම නිමල්" යැයි කීවා. පංතියේ ළමයිනුත් පුංචව සාදරයෙන් පිළිගත්තා.

ඔන්න ගුරුතුමි පුංචට වාඩිවෙන්න තැනක් පෙන්නුවා. පුංචා ඉතා කාරුණික ලෙස එතන ගිහින් ඉඳගත්තා.

පුංචා ළග හිටියේ හරිම පොහොසත් ළමයෙක්. එයාගේ නම දිනිඳු. එයා ළග ලස්සන වතුර බෝතලයක්, කුඩයක්, බෑග් එකක් එහෙම තියනවා. ඒවා නිමල් දැක්කා ඒත් ඒවාට එයා ආසා කළේ නැහැ. දිනිඳු පොහොසත් නිසාද කොහෙදෝ ටිකක් විතර පණ්ඩිතයි. පුංචා ඉතිං එයා එක්ක කතා කරා. එයා වැඩිය කාගෙත් එක්කවත් කතා කරන්නේ නැහැ. හැබැයි පුංචත් එක්ක නම් එහෙම නැහැ. එයා පුංචත් එක්ක නම් හොඳට කතා කරා. පුංචා ඉතිං ඒ ගැන

ගොඩක් සතුටු වුණා. මොකද කීවොත් පුංචට ගමේ කවුරුත් යාලුවෙක් වත් හිටියේ නැති නිසා.

පුංචා ඊළග දවසෙත් උදෙන්ම පාසැලට යන්න සූදානම් වුණා. ඊට පස්සේ එයා එයාගේ සීයාත් එක්ක පාසැලට ගියා. එයා පංතියට ගිහින් ගුරුතුමිය දුන් අසුනෙම හිදගත්තා. ඊට පස්සේ දිනිඳු පුංචට ''සුභ උදෑසනක් නිමල්'' කියලා ඇමතුවද ඔහුට එය අදහාගත නොහැකි කරුණක් විය. නිමල් ටික වෙලාවක් ඒ මේ අත බලමින් කල්පනා කරන්නට විය. කුමක් නිසාද කිවහොත් මොහු මුලින්ම පාසැලට ගොස් එම වචනය ඇසූ පළමු දිනය වූ හෙයිනි. ''ආ... දිනිඳු .... කියා මදක් නිහඬව සිටි නිමල් එක පාරටම දිනිඳු ඔයාටත් සුභ උදෑසනක් වේවා'' කියා අමතන්නට විය. ඉන් පසුව දෙදෙනාම පන්තියේ අසුන් ගන්නා ලදි.

මඳ වේලාවක් ගිය පසු ගුරුතුමිය පංතියට පැමිණ සියලුම ළමයින්ට ආයුබෝවන් ළමයිනේ කියා පවසා අලුත් පාඩමක් පටන් ගත්තා. අද පාඩම උගන්වන විදිහ දිහා පුංචා උනන්දුවෙන් බලා උන්නා. දැන් පොඩි බඩගින්නකුත් නිමල්ට ඇවිත් කන්නම හිතිලා වටපිට බල බලා ඉන්නකොට ඔන්න විවේක කාලය සඳහා සීනුව නාද කළා. පුංචා එයාගේ අම්මා ඔතලා දුන්න බත් මුල දිග ඇරගෙන කන්න පටන් ගත්තා. දිනිඳුත් ලස්සනට පෙට්ටියකට දාගත් කෑමක් කෑවා. නිමල් ඉක්මනින් කා දිනිඳුත් එක්ක පාසැලේ වට පිටාව බලන්න ගියා. ඉස්කෝලය කියන්නේ හරිම සතුටුදායක තැනැක් කියා නිමල්ට හිතුණේ ඒ වෙලාවේදිය. විවේක කාලය අවසන් වන සීනුව නාද වුණා. ළමයින් හැම දෙනෙක්ම පංති වලට ගියා.

ගුරුතුමිය ඉගැන්වූ දේවල් ගුරුතුමිය ආයෙත් මතක් කරා ඉතිං පාසල නිම වන වෙලාව උදා වුණා. පුංචා ඉක්මනට ගෙදර ගියා. ඒ අතර එක ළමයෙක් කෙසෙල් ලෙල්ලක් පෑගී වැටෙන්නට ගියා. ඒ ළමයා බේරුණේ අනූ

නවයෙන්. පුංචා ඒ කෙසෙල් ලෙල්ල අරගෙන අසළ තිබුණු කුණු බඳුනට විසි කරා. පුංචා ඊට පස්සේ ගෙදරට දිව්වා. එයාලගේ ගෙදරට අමුත්තෙක් ඇවිල්ලා. ඒ පුංචගේ මාමා. පුංචා මේ සිද්ධිය අකුරන් නැර අම්මටයි, තාත්තටයි, සීයටයි මාමටයි කිව්වා. මේ ගොල්ලෝ පුංචා ගැන ගොඩක් සතුටු වුණා. පුංචා මේක සිතුවමට නැගුවා. ඊට පස්සේ එයා ඒක එයාගේ මාමට පෙන්නුවා. මාමා කීවා ඔය චිත්‍රය පාට කරන්න ඊට පස්සේ අපි ඕක පත්තරේට දාමු කියලා. පුංචාගේ ඉහේ මලක් පිපුණා වගේ දැනුණා.

පුංචගේ මාමා වෘත්තියෙන් පුවත්පත් නිර්මාණ කරුවෙකි. පසුදින උදෑසනම මාමාගේ රැකියාව සඳහා පිටත්ව යාමට සූදානම් විය. එවිට නිමල් තමා අතින් සිතුවමට නැගූ මේ චිත්‍රයේ වැඩ අවසන් කොට මාමාගේ අතට දී. මාමා “මම පාසැල් යන්න සූදානම් වෙන්නම් කියා” මාමාට වැද පාසැල් යන්න සූදානම් වුණා.

එදා මොර සූරන වැස්සක් ඇද හැලෙන්නට වුණා. ඊට පසුව පුංචා මාමාගෙන් ඇසුවා මාමේ ඔයාට අද යන්නම ඕනෙද කියලා. මාමාගේ පිළිතුර වුණේ “ඔව් පුතේ.. අද ගියේ නැත්තම් ඔයා ඇඳපු චිත්‍රය දෙන්න වෙන්නේ කොහොමද ? . අද තමයි මේක දාන්න තියන අවසන් දවස. ඒ නිසා අපි කොහොම හරි යමු නේද කියලා” මාමා කිවුවා. ආ.. හරි මාමේ එහෙනම් ඉතිං අපි අමාරුවෙන් හරි යන්නත් එපායැ නේද. එහෙනම් යමු කියා අපි දෙන්නම යන්න පිටත් වුණා. ඒත් වැස්ස නම් කොහොමත්ම පායන්නේ නැති පාටයි. පුංචා ඉතිං මේ චිත්‍රය නොතෙමෙන ලෙස පොලිතින් කවරයකින් ඔතා අරගෙන ගියා. ඒත් ටික ටික තෙමිලා තිබුණේ

.

පුංචගේ චිත්‍රය පත්තරේ පළවී ඇති බව දැක පාසැලේ විදුහල්පතිතුමා මහත් තුටට පත්ව නිමල්ට කාර්යාලයට පැමිණෙන ලෙසට දන්වා එවා තිබුණේ

පාසැලේ ශිෂය නායක අයියා කෙනෙකු අතේය. ඒ මොහොතේ නිමල් හොදටම බයවුණේ තමන් කුමක් හෝ වැරදි දෙයක් සිදු කොට ඇතැයි සිතා. ඒ කොහොම වුණත් නිමල් බියෙන් වෙව්ල වෙව්ලා විදුහල්පතිතුමා ළගට ගියා.

එවිට විදුහල්පතිතුමා ''නිමල්'' කියා උස් හඩින් ඇමතූ විට ගැස්සී ''ලොකු සර්'' කියා නිහඩ වුණා. විදුහල්පතිතුමා කීවා ''නිමල් ඔයා ගැන මට හරිම සතුටුයි. නුඹ මේ පාසැලට හරිම  ගෞරවයක්. නිමල් ඇදපු රූපය පත්තරේ පලවෙලා තියනවා දැක්කද කියා ඇසුවා''. අනේ නෑ සර්, කියා නිමල්  පවසා චිත්‍රය දෙස බලා සිටියා. එවිට ලොකු සර් කීවා නිමල් තව තවත් චිත්‍ර අදින්න කියා. නිමල්ට අදහාගත නොහැකි සතුටක් ඇතිවුණා. මේ ආකාරයෙන් දින ගෙවුණා. එදා නිවාඩු දවසක් නිමල් එයාගේ පාසැලෙන් දුන්න ගෙදර වැඩ කරනවා දැකපු නිමල්ගේ  අම්මාට ගොඩක් සතුටු හිතුණා. අම්මා මේ ගැන නිමල්ගේ ගුරුතුමියටත් පැවසුවා. එවිට ගුරුතුමියත් සතුටු වුණා. ඒ සතුට දැක ගෙදර තාත්තයි , චූටයි කැලේ තියන ගඟට පීනන්න ගියා. එයා පීනන්න ගොඩක් දක්ෂයි. ඊට පස්සේ මේ කට්ටිය කැලේ ඇවිදින්න ගියා. මේ ගොල්ලෝ මෙහෙම යන අතරමගදී නැවතිලා ගස්වල රතුපාටට තිබුණු චෙරි ගෙඩි කැඩුවා. චෙරි පඳුරු රතු රෙද්දක් පෙරෙව්වාක් මෙන් ලස්සනයි. මේ ගොල්ලෝ පලතුරු හොයලා ඉවර වෙලා ගෙදර ගියා.

රාත්‍රී කෑම කාලා නිදාගන්න ලාම්පුව නිවනවාත් එක්කම පූංචට පොඩි කෙදිරිලි සද්දක් ඇසුණි. හොදට කන් ඒ දෙස යොමුකර සිටි පූංචා කෑ ගසමින් ''අම්මා'' කියා කළුවරේම අම්මා ළගට දිව ගොස් "අම්මා සීයා පොඩ්ඩක් කෙදිරි ගානවා වගේ මට ඇහෙනවා" කීවේය. ඉන්පසු අප දෙදෙනාම සීයා ළගට යන අතර තුරදී සීයා පපුව අල්ලා ගෙන සිටිනවා දුටු නිමල් සීයා ළගට ගොස් ඇයි සීයා කියා අසන විට "සීයා පපුව රිදෙනවා"

කීවා. එවිට පුංචා තෙල් ටිකක් අතට ගෙන පපුවේ ගාන්න යනවිට සීයා කීවා "අනේ මගේ පුංචි පුතේ, දැන් මම වයසයි. මට මොකුත් වුණාට දුක් වෙන්න එපා. මගේ පුතා ඉස්කෝලේ ගිහිං හොඳින් වැඩ කරලා ලොකු මහත්තයෙක් වෙයන් කියලා." ඒ කියලා සුළු මොහොතයි ගත වුණේ. සීයා නිහඬව ගල් ගැසුණා. පුංචා දන්නෙත් නැහැ මේ මොකද වුණේ කියලා. ඊට පසුව අම්මා ඇවිත් කියන විට තමා පුංචා දන්නේ සීයා මියගොස් කියා. ඒ මොහොතේ අම්මා හඬා වැළපුණාට පුංචට එතරම් තේරුමක් නොතිබුණි. මළගෙදර කටයුතුත් අවසන්ව දින හතක්ම නිවසේ සිට දැන් පුංචා පාසලට යන්න සූදානම් වුණා.

දැන් නිමල් තුන්වන වසරේ ඉගෙනුම ලබන පුංචි දඟකාර ළමයෙකි. මෙහෙම පංතියේ සිටින විටදී විදුහල්පතිතුමා නිමල්ට චිත්‍ර තරගයක අයදුම්පතක් පංතිභාර ගුරුතුමිය අතේ එවා තිබුණා. පුංචා ඉතිං මේ චිත්‍ර තරගයට ඇන්දා . ඒ තරගයට ඇන්දේ පුංචා මහත් සේ ආදරය කළ පුංචගේ සීයාගේ ගොවිපලයි. මේ විදිහට කාලය ගත වෙද්දි මේ තරගයේ ප්‍රතිපල නිකුත් වෙලා තිබුණා. මේ තරගයෙන් පළමු ස්ථානයම නිමල්ට ලැබී තිබුණේ සිතාගත නොහැකි අයුරකිනි. එදින සිට නිමල් කියන නම පාසලේ ප්‍රසිද්ධ වුණා. සියලු දෙනාගෙන්ම තෑගි බෝග ලැබුණා. නිමල්ට ලැබුණු මේ තෑගිබෝග නිසා සෑහෙන කාලයක් ඒ පොත් පත් පරිහරණය කරන්නට හැකි වුණා. ටික කලක් ගතව ගියා ඊට පසුව සමස්ත ලංකා චිත්‍ර තරගයකට අඳින්න කියලා පාසැලෙන් අයදුම් පත්‍රයක් එවා තිබුණා. ඒත් නිමල් මේ කිසිම දෙයක් තේරුමක් නැතිවයි කරන්නේ. එයා දන්නේ නැහැ සමස්ත ලංකා තරග කියන්නේ මොකක්ද කියලවත්. ඒ වුනාට මෙයා ඒ චිත්‍රයත් ලස්සනටම ඇන්දා. සමස්ත ලංකා තරගයෙන් පාසැලට දෙවැනි ස්ථානය හිමි වුණා. ඒ මොහොත වන විට නිමල් පාසැලේ ප්‍රසිද්ධ වෙලා. එනිසාම

නිමල්ට පාසැලේ සියලුම දේවල් උනන්දුවෙන් කරන්න ඕනේ කියලා හැඟීමකුත් ආවා.

දැන් පාසැලේ 5 වන වසරේ ඉගෙනුම ලබන නිමල්ට ගුරුතුමිය කීවා ශිෂ්‍යත්ව විභාගයක් කියලා දෙයක් තියනවා ඒකට උනන්දුවෙන ළමයින්ට විතරයි ලොකු ඉස්කෝලයකට යන්න ලැබෙන්නේ. ඒ නිසා යන්න ආසාවක් තියනවානම් උනන්දුවෙන් වැඩ කරන්න කියලා. ඒ වෙලාවේ ඉඳලා නිමල්ගේ සිත වැඩ කරේ ලොකු ඉස්කෝලයකට යන්නේ කොහොමද කියලයි. නිමල් දැන් හරිම කඩිසරයි. 5 වන වසරේ ඉගෙනුම ලබන නිමල්ට පළමු වාර විභාගය ලියන්න අවස්ථාව උදා වෙනවා. මෙයා හොදට පාඩම් කරනවා. විභාගයෙන් පංතියේ 4 වන ස්ථානය ලබාගත් නිමල් සිතුවේ තව තවත් ඉදිරියට යාමටයි. 1 ස්ථානය ලබා ගත්තේ මගේ යහළුවා දිනිඳුයි. එයා සියලුම අමතර පංති වලටත් යනවා. පුංචට පංති යන්න සල්ලිත් නැහැ, අනිත් ළමයි යනවා කියා එයා දුක් වුනෙත් නැහැ. මොකද මෙයා තේරුම් ගත්තා මට මගේ පංතියේ ගුරුතුමිය මට ඉන්නවා කියලා. නොදන්නා දේවල් සියල්ලම ඊට පසුදා ගුරුතුමියගෙන් අහලා දැනගත්තා. ඒ වගේම පාසැලේ තියෙන සියළුම බාහිර වැඩ වලට ඉදිරිපත් වුණේ නිමල්. එයාගේ යටපත්ව තිබූ දක්ෂතා බොහොමයක්ම එයාගේ ගුරුතුමිය දැකලා ඒවාට උදවු දුන්නා. පාසැලේ පැමිණීම අතින්ද ඉදිරියෙන්ම සිටින්නේද නිමල්.

දින සති ගෙවී ගියා දෙවන වාර විභාගයත් එළඹුණා. එවිට නිමල් පෙර පරිදි මෙන් නොව වඩාත් උනන්දුවෙන් පාඩම් කළා. ඒ වාරයේදී 1 ස්ථානය නිමල්ට හිමි වීමත් සමගම පංතියේ සියලු දෙනා වෛර කරන්ට ගත්තේ ඒ මොහොතේ සිටයි. ඒ ඒ කිසිදු දෙයකින් දුක් නොවුණු නිමල් කෙසේ හෝ ඊළඟ වාරයේදීත් පළමු වැනියා වීමට බලාපොරොත්තුවෙන් සිටියා. නමුත් පංතියේ ළමයින්ගේ දෙමාපියන් නොයෙකුත් කතා නිමල්ට පවසා නිමල්

ඉතා අසරණ කොට තැබුවා. ඒ මොහොතේදී නිමල් අසරණ වුවා. පාඩම් වැඩ ගැන වැඩි උනන්දුවක් දැක්වුයේද නැහැ.

ඒ නිසාම  නිමල්ගේ අම්මත් දැන් නිමල්ට ගොඩක් උදවු කරනවා. නිමල් වැඩ ගැන වැඩි උනන්දුක් දක්වන්නේ නැති නිසා පසුගිය විභාග පත්තර කරපු අයගෙන් ඉල්ලලා ගෙනත් ඒවා කොළවල ලියලා නිමල්ට විසඳන්න දෙනවා. හැමදාම නිමල් ගෙදර එනකොට ගැටළු ලියලා තියනවා. ඒ ගැටලු ගුරුතුමිය බලලා දෙනවා . ඒ වගේම නිමල්ගේ අම්මා නිතරම පැවසුයේ පුතේ ඔයා පරිසරයත් එක්කම කාලය ගත කරන්න. මිනිස්සු කියන කිසිම දෙයක් හිතට ගන්න එපා. එතකොට හොදට විභාගය ලියන්න පුලුවන් කියලයි.

දැන් තුන්වන වාර විභාගයත් ලියපු නිමල් පංතියේ අඩු ලකුණු මට්ටමට පත්වුණා. දැන් නිමල් හරිම අසරණයි. ගුරුතුමියටත් හිතා ගත නොහැකි විය. සියලු දෙනාගේම බලාපොරොත්තු සුන් වෙලා වගේ. නිමල් ඒ කිසිම දෙයක්  ඔලුවට ගෙන කටයුතු කළේ නැහැ. කාලය ගෙවී ගියා විභාග දිනයත් ලංවුණා. නිමල් සියලු ගුරුවරුන්ගේ ආශිර්වාදය මැද විභාගයට පෙනී සිටියා. ඒ වුනාට නිමල්ගේ යහළුවන්ගේ දෙමාපියන්ගේ සිතුවිල්ල වුණේ නිමල්ට පාසලෙන් පමණක් ඉගෙනීම ලැබුණු නිසා එයාලාගේ ළමයින් ඉතා ඉහළින් සමත් වේය  කියා. නිමල්ට කිසිම දෙමාපියෙක් ආශිර්වාද කළේද නැත. තැන තැන කසු කුසුව ඇසෙන්ට වුනේ අපේ ළමයා නම් වැඩේ කර ගනියි කියමිනි. පන්සලේ හාමුදුරුවන් පිරිත් නූලක් දමා නිමල්ට ආශිර්වාදය ලබාදුන්නා.

දැන් විභාග ශාලාවම නිශ්ශබ්දය. නිමල්ට ලැබි තිබුණු අංකය මත වාඩිවුණු නිමල් ප්‍රාර්ථනා කලේ මට උදවු උපකාර කළ මගේ අහිංසක

දෙමව්පියන්ගේත්, මගේ ආදරණීය ගුරු මෑණියගේත් බලාපොරොත්තුව ඉෂ්ඨ කර දෙනවා කියන ප්‍රාර්තනයයි.

දැන් විභාගය පළමු පත්‍රය අවසන් ඊළඟට දෙවන පත්‍රය අතට ලැබුණි. රචනාවත් හොදටම ලියපු නිමල් පරිසරය කොටස දෙසට යොමු විය. එවිට ඔහුට සිතුනේ මේවටද මම පංති යන්න ඕනේ කියලයි. මොකද මගේ සීයා මට මේ හැම දෙයම පෙන්නලා කියලා දීලා තියනවානේ කියලයි. ඒ වෙලාවේදි මට පොඩි දුකකුත් ඇති වුණා. මොකද මගේ සීයා ඒ වන විට ජීවතුන් අතර නොසිටීමයි. කමක් නැහැ මගේ සීයා කොහේ හිටියත් සීයාට පිං. කියා පිං පතමින් සිටි නිමල් ළගට පැමිණි ශාලාධිපතිනිය පවසා සිටියේ තව සුලු වෙලාවක් පමණක් තිබෙන බවයි. දැන් විභාගය අවසන් විය.

ළමයි නිදහස් කුරුල්ලන් මෙන් දිව යයි. මාද විභාගය අවසන් කොට ගෙදරට යන අතර මගදී මගේ යහලුවාගේ දෙමාපියන් එයාට 6 වසර සදහා ටවුමේ පාසලකට දමනවා කියා තීරණය කරමිනුත් යනවා. ඒ ඇසුණු නිමල් සිතුවේද දිනිදුට නම් හොඳ පාසලකට යන්න වාසනාව තිබෙනවා කියලයි. නිමල්ගේ බලාපොරොත්තුව වුණේ ද විභාගය සමත් වීමයි.

දිනිඳුගේ අම්මා ඒ මොහොතේ නිමල්ගෙන් විමසුවේ විභාගය ලෙහෙසියද කියලයි. එවිට නිමල් පවසා සිටියේ තරමක් විතර කියලයි. දිනිඳුට නම් හොදටම ලෙහෙසිලු කියා දිනිඳුගේ අම්මා කීවා.

එවිට නිමල් "දිනිඳු මට හරි සතුටුයි ඔයාට ලොකු ඉස්කොලයට යන්න පුළුවන් වේවි නේද? මට නම් හරියටම කියන්න බැහැ. බලමු නේද" කියා නිමල් කීවා.

විභාග ප්‍රතිපල නිකුත් කළ බව රේඩියෝවෙන් අසන්නට ලැබුණත්, නිමල්ට දුරකතනයක් නොතිබිණි. පාසලට යන මොහොත තෙක් නිදි මරා සිටි

නිමල් උදෑසන පාසලට ගිය මොහොතේ දැනගන්නට ලැබුණේ නිමල් ඉහළින්ම විභාගය සමත්ව ඇති බවයි.

අනේ නිමල් ඉක්මනටම දිව ගියේ එයාට උදවු උපකාර කළ ගුරුතුමිය දෙසටයි. ගුරුතුමිය බදාගත් නිමල් මට මගේ ගුරුතුමිය අද මැණිකක් වගේ වටිනවා කියා පවසා හඬන්නට විය. මොකද ගුරුතුමියට පංතියේ අනික් සියලුම දෙමව්පියන් කීවේ හරියට උගන්වන්නේ නැහැ කියලයි. ඒ නිසා තමයි මට දුක හිතුණේ. මම ඒ අයට පෙන්නුවා මගේ ගුරුතුමිය මට උගන්වපු හැටි කියලා කිවුවා. මගේ ගුරුතුමියට බුදු සරණයි. මම අද මේ ජය ලැබුවේ එතුමිය නිසායි.

පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොට ගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔපනැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂන ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී . ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යංතර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රිය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිය යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෙ රවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01